# 16
# දරිද්‍රතාවය මැද

"දිළිඳුකමත් වලිගය නැති ගොනා වැනි"
"හිඟන්නන්ට කොයින් ද උණු බත්"
"දිළිඳු කම ඉදිරි දොරින් ඇතුළුවන විට ප්‍රේමය පිටුපස දොරින් පලා යයි"

දරිද්‍රතාවය මේ මිහිතලය මත විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වන බව ඔබට පෙනෙනු ඇත. දරිද්‍රතාවය නිසා ජනතාව සමාජයක් ලෙස එක් ව යන ගමනේ වර්ධනය අඩාල වීමක් සිදු වේ. දිළිඳුකම සමාජය තුළ පැවතීම දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හා එකඟ ද යන්න කිතුනුවන් හැටියට විමසිල්ලෙන් සලකා බැලිය යුතු ය.

ජීවිතයේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි ව සිටීම තුළ දරිද්‍රතාවය මිනිස් ලෝකය අද මනා ලෙස අත් විඳියි. එසේ ම ජීවිත ආකල්ප / ආධ්‍යාත්මික / හා සදාචාරාත්මක දිළිඳුභාවයට ද පුද්ගලයන් හා සමාජය පත්වෙයි.

ජේසුස් වහන්සේ සාමාන්‍ය යුදෙව් පවුලක උපත ලැබූ සේක. ජෝසප්තුමා මරියාතුමිය පවුලේ අය සමඟ ගත කළ ජීවිතයේ අග හිඟ නොතිබුණා විය නොහැකි ය. එතුමා ජීවත් වූ සමාජයේ සාමාන්‍ය ජනතාව අතරේ ආගිය එතුමෝ ඒ සියල්ල මැද මිනිස් ජීවිතයට නව බලාපොරොත්තුවක් හා අර්ථයක් ලබා දුන්හ. මිශ්‍ර ජන සමූහයක් මැද දිවි ගෙවූ එතුමෝ කිසි භේදයක් නැති ව මිනිස් අවශ්‍යතා ගැන අනුකම්පාවෙන් ද දයාවෙන් ද මානව හිතවාදී ලෙසට ද බැලූහ. දේව රාජ්‍යයේ පුරවැසිකම ලබන්නට හැමට ඇරයුම් කළහ. ධනවතුන්ගේ ජීවිත පරිවර්තනයක් ද බලාපොරොත්තු වූහ.

## (1) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුළින් මතුවන අදහස්

- ධනවත් වීම දේවරාජ්‍යයේ පුරවැසිකම ලැබීමට බාධාවක් විය හැකි ය. දෙවිඳුන් මත නොපිහිටා එතුමන් මත නොයැපෙමින් ධනය මත යැපීමට යොමු වන බැවිනි.

( ශු.ලූක් 12 : 13  21 පොහොසත් මෝඩයා )
( ශු.ලූක් 18 : 18  36 පොහොසත් ප්‍රධානියා )

- පොහොසතකු දිළිඳුන් ගැන ක්‍රියා කිරීම ද මානව හිතවාදී වීම ද අවශ්‍ය ව තිබෙන අතර ධනය ආත්මාර්ථකාමී තත්ත්වයට පොළඹවයි.

( ශු.ලූක් 16 : 19  31 ධනපතියා හා ලාසරස් )

- පොළොවේ වස්තුව විනාශ වී යන අතර කිතුනු ජීවිත රටව තුළින් ස්වර්ගික වස්තු රැස් කිරීම කළ යුතු ය.

( ශු.මතෙව් 6 : 19  21 )

- දිළින්දාට තම සම්පූර්ණ යැපීම දෙවිඳුන් මත තැබීමට අවස්ථාව ඇත.

( ශු.මතෙව් 6 : 11 )

- දිළින්දකු වීම පමණක් දේවරාජ්‍යයට ඇතුළුවීමට අවසර පතක් නොවේ. ක්‍රිස්තුස් වහන්සේ තුළ පිහිටා සිටිමින් දේවරාජ්‍යයේ අගයන් අනුව ජීවත් විය යුතු ය.

( ශු.මතෙව් 22 : 13 )

- අධ්‍යාත්මික දරිද්‍රතාවය සදාචාරධර්ම වර්ධනය හීන වීම තුළ දරිද්‍රතාවය මෙයින් ගොඩ ඒමට පෞද්ගලික ජීවිතය හා සමාජය, සාමය, ප්‍රේමය හා යුක්තිය යන සාර ධර්මවලින් පොහොසත් කළ යුතු යි.

( ශු. ලූක් 12 : 13  21, 18 : 9  14, ශු. මතෙව් 18 : 21  35 )

- පොහොසතාගේ වැඩිමනත් දෙයින් දෙවිඳුන් පිදීමට වඩා දිළින්දා දරිද්‍රතාවය මැද පුදන්නට පෙළඹෙන අතර එය දෙවිඳුන් ඉදිරියේ ගෞරව ලබන්නක් වෙයි.

( ශු.මාක් 12 : 41  44 )

## 2. මුල් කිතුනු සභාව දරිද්‍රතාවය හමුවේ ක්‍රියා කළේ කෙසේ ද?

රෝම 15 : 25
2 කොරින්ති 8 : 1 5
ගලාති 2 : 10

ක්‍රියා 2 : 42 47
ක්‍රියා 2 : 32 37

- සහනාධාර ලබා දීමෙන් . (රැකබලා ගැනීම, පෝෂණය, බෙදාගැනීම)
- හිඟකම ඇති අය නැති වීම.
- එය කිතුනු මෙහෙවරක් ලෙස තේරුම් ගෙන සංවිධානාත්මක ව වගකීමෙන් යුතුව කටයුතු කිරීමෙන් .
- ගැටළු දුෂ්කරතා හා අර්බුද මැද පසුබට නොවී වඩා සංවිධානශීලී ව ක්‍රියා කිරීම තුළින්.
- කිතුනුවාගේ දිළිඳුන් රැකබලා ගැනීම මෙහෙවර ඇරඹුණේ ක්‍රිස්තුස් වහන්සේ සමඟ තැබෙන සබඳතාවයේ ප්‍රතිඵලයක් ලෙසිනි. (ක්‍රියා 6 : 3 6 ක්‍රියා 7 : 54 : 60 )
- දරිද්‍රතාවය මුහුණ දෙන පිළිවෙළ අධ්‍යාත්මික ධනවත්භාවය කරා පරිවර්තනය වීම.

## 2. දරිද්‍රතාවය පිටුදැකීමේ අභිලාෂය


- දිළිඳුන්ට උපකාර කිරීමෙන් ඔවුන් රැකබලා ගැනීම ද පෝෂණය ද සිදු වෙයි. නමුත් ඒ හා අනුබද්ධ ව යුක්තිගරුක සමාජයක් බිහි කිරීම සඳහා කටයුතු කළ යුතු වෙයි.
- මුලු විශ්වය ම මනහර නිර්මාණයකි. එහි සම්පත් නිසි ලෙස පුද්ගලයන් අතරේ බෙදී යා යුතු ය. සම්පත් කුඩා කණ්ඩායමක් උදුරා ගැනීම හෝ තමා වටා තබා ගැනීම නිසා දරිද්‍රතාවය බිහි වේ. සමානත්වයෙන් සමසේ සම්පත් ලෝකය තුළ බෙදී යෑමේ කළමනාකාරිත්වය ඇති කළ යුතු ව තිබේ.
- සමාජය තුළ අවිචාරවත් හැසිරීමේ ප්‍රතිඵලය ( සොරා ගැනීම, වංචාව, නාස්තිය හා ශ්‍රම සූරාකෑම) දිළිඳුන් සමාජය තුළට එක් කරනු ලැබීම යි. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා යුක්තිගරුක භාවය ද සමානත්වය ද යන අගයයන් සමාජය තුළ ස්ථාපිත වීම අවශ්‍ය ය.
- ජීවිතය දෙස ධනාත්මක චින්තනය අනුව බලන්නට පෙළඹිය යුතු ය. එහි දී තම ජීවිත වටිනාකම හා සමාජ මෙහෙවර තේරුම් ගැනීමට උනන්දුවෙන් ද ජවයෙන් යුතුව ද ක්‍රියා කිරීම. ( හිතෝපදේශ 26 : 13 15 , 6 : 6 11) අවශ්‍ය වේ.

- අලසකම දරිද්‍රතාවය ඇති කරයි. යන මතයට සමාන්තර ව එසේ සිදුවන්නේ සමාජයේ ඇති අක්‍රමිකතා නිසා බවට වන දෙවන මතයක් අද ලෝකය තුළ පවතී.

- කිතු සසුන තුළ පොහොසතුන් අතළොස්සක් හා දිළිඳුන් රාශියක් සිටීම දේව රාජ්‍යයේ ප්‍රතිපත්තිවලට නොගැලපෙයි. සහනාධාර සැපයීම මත පමණක් නොරැඳී ජීවිත ආකල්ප වෙනස් කිරීම කරා (ශු. ලූක් 19 : 1 10 ) පරිවර්තනයක් සිදු විය යුතු ය.

- කිසි භේදයක් නොමැති ව සමස්ත සමාජය ම සාමය , ප්‍රේමය , යුක්තිය හා දයාව යන දේව රාජ්‍යයේ අගයයන්වලින් ධනවත්භාවයට පැමිණීම අවශ්‍ය ය. එසේ මේ අගයයන් සහිත ව ජීවත් වෙමින් එකිනෙකා අතර යහපත් සබඳතා ගොඩනැගීමට දායකත්වය දීම කිතුනු ඔබේ ද වගකීම යි.

කිතු සසුන තුළ සිය කැමැත්තෙන් ම දිළිඳු භාවයට පත් ව ලෝකයා තුළ ක්‍රිස්තුස් වහන්සේ ගේ ප්‍රේමය මාංශවත් කරන බොහෝ දෙනෙක් අප අතර සිටිති. ඒ තුළින් ද ශ්‍රී ලාංකික කිතු සසුන සමාජය ගැන තම වගකීම් ඉටු කරන්නට ක්‍රියා කරමින් සිටින බව මනා ලෙස පසක් වෙයි.



❖ **ඇගැයීම :-**

1. සමාජය තුළ දිළිඳු භාවය පිටු දැකීම සඳහා ඔබ යෝජනා කරන්නේ කුමක් ද?

2. ලෝකය තුළ සම්පත් බෙදී ගොස් ඇති ආකාරය වගු ගත කරමින් යම් ප්‍රදේශයක් හෝ රටක් තෝරා ගෙන දරිද්‍රතාවයට පාදක ව තිබෙන කරුණු රැස් කරන්න.